# ග්‍රාමවාසී සම්ප්‍රදායේ ආරම්භය, විකාසය සහ අනන්‍යතා පිළිබඳ සංක්ෂිප්ත කියවීමක්

වටරක්ගොඩ සුමන හිමි

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ භික්ෂු කණ්ඩායමක් හැඳින්වීමට ග්‍රාමවාසී යන නාමීකරණ භාවිතය ආරම්භ වන්නේ ක්‍රි.ව. දහවන සියවසින් පසුවය. පළමු වතාවට එකී නාම භාවිතය හමුවන්නේ දඹදෙණි කතිකාවතෙනි. එම සම්ප්‍රදායට අයත් භික්ෂූන්ගේ ක්‍රියාකලාපයන් සහ ජීවන පසුබිම් අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ තත්කාලීන සාමාන්‍ය ජනසමාජය සමග ගැටෙමින් ලෞකික ලෝකයේ අභිවෘද්ධිය පිණිස ද වැඩකටයුතු කළ භික්ෂූන් ග්‍රාමවාසී යනුවෙන් හඳුන්වන ලද බවයි.

**හැඳින්වීම**

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ සංඝ සමාජයේ විවිධාකාර විභේදනයන් දක්නට ලැබේ. මෙම ලිපියේ අරමුණ වන්නේ එම විභේදනයන් අතුරින් ආරණ්‍යවාසී සහ ග්‍රාමවාසී වශයෙන් මතු වූ බෙදීම සම්බන්ධව යම් අධ්‍යයනයක් සිදුකරමින් ග්‍රාමවාසී භික්ෂුවගේ ස්ථාපිත වීම කෙසේ සිදුවූයේදැයි යන්න පිළිබඳව පරීක්ෂා කිරීමයි. මෙහිදී මෙකී බෙදීම ඇති වූ බවට හඳුනාගන්නා දඹදෙණි යුගය සහ තදාසන්න සමය පමණක් අවධානයට ගනු ලැබේ. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ.

භික්ෂු සමාජයේ ඇති වූ මෙම බෙදීම සම්බන්ධයෙන් ගැඹුරු පර්යේෂණ සිදුකෙරී නැත. එබැවින් මෙහි දී කරුණු සොයා යාමේ දී ත්‍රිපිටකාගත තොරතුරු සහ අට්ඨකතා බොහෝ සෙයින් වැදගත් වේ. **මහාවංසය**, **නිකායසංග්‍රහය**, සංදේශ කාව්‍ය මෙන්ම පොළොන්නරු කතිකාවත සහ දඹදෙණි කතිකාවත යනාදිය ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් මෙහි දී අධ්‍යයනයට බඳුන් කරනු ලැබේ. ග්‍රාමවාසී සහ අරණ්‍යවාසී

බෙදීම සම්බන්ධයෙන් යම් ආකාරයක අදහසක් ඉදිරිපත් කොට ඇත්තේ වල්පොළ රාහුල හිමියන්, මැන්දිස් රෝහණධීර සහ රණවීර ගුණවර්ධන යන වියතුන් පමණි. මෙහි දී එකී අදහස් සම්බන්ධයෙන් ද අවධානය දක්වමින් මෙම සංක්ෂිප්ත අධ්‍යයනය සිදුකෙරේ.

**සාකච්ඡාව**

මුල් කාලයේ සංඝ සංස්ථාව පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී භික්ෂූන් වහන්සේලා අතර ග්‍රාමවාසී හෝ අරණ්‍යවාසී යනුවෙන් බෙදීමක් තිබුණු බව දැක ගත නොහැකිය. එසේ වුවද ග්‍රාමවාසී හෝ අරණ්‍යවාසී යනුවෙන් භික්ෂු කණ්ඩායම් නිර්මාණය වීම අහඹුවක් විය නොහැකිය. එනිසා භික්ෂු වංස කථාවේ අරණ්‍යවාසී හා ග්‍රාමවාසී යන භික්ෂු විභේදනයන් කවර අංගයන් සමග ගොඩනැඟෙන්නේද යන්න පිළිබඳව සූක්ෂම ගවේෂණයක් සිදුකළ යුතු වෙයි.

බෞද්ධ දර්ශනයේ ඉගැන්වෙන පුද්ගල විමුක්ති සාධනය ලබා දෙන නිර්වාණය අත්පත් කරගැනීම ඒකායන පරමාර්ථය කරගත් පිරිසකගෙන් භික්ෂු සංස්ථාව නිර්මාණය වීය **(ධම්මකුසල හිමි, (සංස්.) 1957: 173)**. පුද්ගල විමුක්තිය ලබා ගැනීමෙන් අනතුරුව එකී සංස්ථාව නිර්මාණය කළ බුදු හිමියන් සේම අනුගාමිකයන්ද සිදුකළේ තමන් ලද විමුක්ති සුවය සත් වගට සෙත් පිණිස බෙදාදීමය. බුදුන් වහන්සේගේ පිරිණිවීමෙන් අනතුරුව වුවද මෙකී ක්‍රියාවලිය මෙලෙසින්ම ඉදිරියට ගමන් කළ බව හඳුනාගත හැකි අතර නිකායාන්තරික වශයෙන් වුවද භික්ෂූන් වහන්සේලා විභජනයට ලක් වුවද මෙකී ක්‍රියාවලියේ වෙනසක් වූ බව හඳුනාගත නොහැකිය. මිහිඳු හිමියන්ගේ ආගමනයෙන් පසුව ලංකාව තුළද සිදු වූයේ භික්ෂුව විසින් ස්වකීය විමුක්ති සාධනය සලසා ගැනීමෙන් අනතුරුව පරාර්ථ චර්යාවේ හැසිරීමය.

ග්‍රාමාවාසී යනුවෙන් අලුත් නාම ව්‍යවහාරයක් ක්‍රි.ව. දහවන සියවසින් පමණ පශ්තචාත් කාලීනව භාවිතයට පැමිණියද එය හුදු නාම විශේෂණයක් බව හඳුනාගත හැකිය. එසේ වුවත් ගමෙහි වසන යන අරුතින් ග්‍රාමාවසී යනුවෙන් හැඳින්වෙන්නේ නම් ඊට ප්‍රතිවිරුද්ධ ලෙසින් කැලෙහි වසන යන අරුතින් ආරණ්‍යවාසී යනුවෙන් තවත් කණ්ඩායමක් තිබිය යුතුය. අරණ්‍යවාසී යනුවෙන් භික්ෂු කණ්ඩායම් නවවන සියවසේ පමණ සිටි බවට සාධක හමුවන බැවින් **(බුද්ධදත්ත**

**හිමි, (සංස්) 1959: ගාථා-52)** එම කණ්ඩායමට ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් හැඳින්වීම සඳහා ග්‍රාමවාසී යන නම භාවිත කරන්නට ඇතැයි අනුමාන කළ හැකිය. ග්‍රාමවාසී සහ ආරණ්‍යවාසී සම්ප්‍රදායන්හි ප්‍රභවය පිළිබඳව අධ්‍යයනය කරන වල්පොළ රාහුල හිමියන් එය පර්යාප්තිය සහ ප්‍රතිපත්තිය පදනම් කරගනිමින් බිහිවන්නට ඇති බව පෙන්වා දීමට උත්සහ දරා තිබේ **(රාහුල හිමි, 2009: 163).**

ක්‍රි. පූ. පළමුවන සියවස ලංකා ඉතිහාසය තුළ, විදේශ ආක්‍රමණයන් සේම ස්වභාවික විපත් නිසාවෙන්ද අතිශය ව්‍යසනකාරී තත්ත්වයකට පත්වූ කාල පරාසයක් ලෙස සනිටුහන්ව තිබේ **(බුද්ධදත්ත හිමි, (සංස්) 1959: ගාථා-52; පඤ්ඤානන්ද හිමි, (සංස්) 1932: 449-450).** මෙම ව්‍යසනකාරී තත්ත්වයන් දුරු වී ගිය පසු කල්ලගාම ජනපදයේ මණ්ඩලාරාම නම් ආරාමයකදී සියගණන් භික්ෂූන් රැස් වී පැවැත් වූ සම්මේලනයකදී අලුත් ප්‍රශ්නයක් මතු විය. එනම්,

''පරියත්ති නු බො සාසනස්ස මූලං - උදාහු පටිපත්තීහි'' **(අංගුත්තර නිකාය, Chatta sangayana CD ROM,** 10. 130)

සසුනට මූල පර්යාප්තිය ද? ප්‍රතිපත්තිය ද? යනුවෙනි. මෙම ගැටලුවේදී දෙපසට බෙදුණු භික්ෂූහු තම තම මතයන්හි ජයග්‍රහණය සඳහා කටයුතු කළහ. අවසන ප්‍රතිපත්තිය මූලයයැයි කියූවන් පරදා සසුනට මූල පර්යාප්තියයැයි කිවූවෝ ජයග්‍රහණය කළහ. මේ තීරණය මත පදනම් වන **අංගුත්තර නිකායට්ඨකථාව.**

''ආරද්ධ විපස්සකානං භික්ඛූනං සතේපි සහස්සේපි සංවිජ්ජමානේ පරියත්තියා අසති. අරිය මග්ගේ පටිවේධෝ නාම න හොන්ති'' **(අංගුත්තර නිකාය, Chatta sangayana CD ROM,** 10. 130**)**

විදර්ශනාවේ යෙදෙන භික්ෂූන් සියයක් හෝ දහසක් සිටියත් ආර්ය මාර්ග ප්‍රතිවේදයක් නොවේයැයි ප්‍රකාශ කරයි. මෙකී මතයම **දීඝ නිකායට්ඨකථාවේ** සහ **මජ්ඣිම නිකායට්ඨකථාවෙහිද** දැක්වේ **(දීඝ නිකාය, Chatta sangayana CD ROM,** 5. 161; **මජ්ඣිම නිකාය, Chatta sangayana CD ROM,** 2. 129**).** මෙකී තොරතුරුවලින් පෙන්වා දෙනුයේ ප්‍රතිපත්තියට වඩා පර්යාප්තිය උසස් වන බවයි. එහෙත් ධම්මපදයේ දැක්වෙන්නේ පර්යාප්තියට කෙතරම් පොහොසත්

වුවත් ප්‍රතිපත්තියෙන් හීන නම් එබඳු භික්ෂුවගේ මහණකම ඵලදායක නොවන බවය **(අනන්ද මෛත්‍රීය හිමි, (සංස්) 1995: 08)**. එසේ වුවත් අට්ඨකථා රචිත යුගය එනම්, ක්‍රි. ව. පස්වන සියවස වන විට ප්‍රතිපත්තිය පරයා පර්යාප්තියේ ප්‍රබලතාව ඉස්මතු වීමට තදනුබද්ධ සමාජමය කාරණාවන් බලපාන ලද බව පෙනෙයි. පර්යාප්තිය දරන භික්ෂූන් වහන්සේලා සාමාජික කටයුතුවලට සක්‍රීය දායකත්වයක් ලබා දෙන ලද බැවින් උන්වහන්සේලාට වඩා වැඩි වටිනාකමක් හිමිවන්නට ඇති බව වටහාගත හැකිය. විදර්ශනා වඩන ප්‍රතිපත්තිකාමියා සමාජයෙන් ඈත්ව විවේකීව කල් ගෙවූ බැවින් එවැනි පුද්ගලයගේ එතරම් වටිනාකමක් නොවීය.

පර්යාප්තිය හා ප්‍රතිපත්තිය සම්බන්ධිත මෙම අදහස් වර්ධනය වීමත් සමග ඒ හා සම්බන්ධ විය යුතු සිද්ධාන්තයක් ලෙස ග්‍රන්ථ ධූරය හා විදර්ශනා ධූරය නමින් පහළ වූවා සේ පෙනේ **(රාහුල හිමි, 2009: 165)**. ධර්ම කරුණු පිළිබඳව අවබෝධය ලබා ගැනීම සහ තමා ලබාගත් දැනීම තවත් අයෙකුට ලබාදීම ග්‍රන්ථධූර යන්නෙන් අර්ථ ගැන්වෙන අතර අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන තිලකුණු මෙනෙහි කරමින් බවුන් වැඩීම විදර්ශනාධූර නමින් හඳුන්වයි **(ධම්මපට්ඨ කථා, Chatta sangayana CD ROM,** 01.01). ග්‍රන්ථධූර හා විදර්ශනාධූර යන්නෙන් කවරාකාර වූ තත්ත්වයන් පිළිබඳව අදහස් කළේ ද යන්න පිළිබඳව තොරතුරු අනාවරණය කර ගත යුතු වන්නේද අට්ඨකථාවලිනි.

''අහං මහල්ලක කාලේ පබ්බජිතෝ, ග්‍රන්ථධූරං පූරේතුං න සක්ඛිස්සාමි. විපස්සනාධූරං පන පූරෙස්සාමි.''**(ධම්මපට්ඨ කථා, Chatta sangayana CD ROM,** 01.01).

**ධම්මපදට්ඨ කථාවේ** අන්තර්ගත මෙකී පාඨවලින් පෙනී යන්නේ ග්‍රන්ථධූරය පුරන්නේ බුද්ධිසම්පන්න දක්ෂ භික්ෂූන් බවත් වයසට ගොස් පැවිදි වූ බුද්ධිහීන ශරීර ශක්තියෙන් තොර වූවන් විදර්ශනා ධූරය වඩන බවත්ය. එසේම මෙයින් සමාජ සේවයක් කිරීමට කාලයක් නැති එහෙත් ඉක්මනින් පුද්ගල විමුක්තිය සාධනය කරගැනීමට අවශ්‍ය භික්ෂූන් විදර්ශනා ධූරය වඩන ලද බවත් පැහැදිලි වේ.

කෙසේ වෙතත් භික්ෂු සමාජය තුළ අලුතින් මතු වූ මෙම නව ප්‍රවණතාවයන් හේතුවෙන් ප්‍රායෝගික තලයේද වෙනස්කම් සිදුවූ බවට

සාධක හමුවේ. විදර්ශනා ධුරය ඉක්මවා ග්‍රන්ථ ධුරය ප්‍රබලව නැගීමේ ප්‍රතිඵල වශයෙන් ප්‍රතිපත්තිය උගන්වන විනය පිටකයට වඩා අභිධර්ම පිටකය අගයෙන් වැඩි වටිනාකමක් සහිත අධ්‍යයන ක්ෂේත්‍රයක් වන බව පෙනෙයි.

''වන වළා කියන බික් සඟ හිමියනට් කඩින් පිඩින් වසග් පසක් ඉසා සුතත් වළා කියන බික් සංග් හිමියනට් වසග් සතක් ඉසා බිදම් වළා කියන බික් සඟ් හිමියනට් වසග් දොළොසක් ඉසා දියැ යුතු'' **(Wikcramasingha (ed) 1928: 85)**.

හතරවන මිහඳු රජුට අයත් පුවරු ලිපියක් වන මෙහි අන්තර්ගතව ඇති ආකාරයට විනය පිටකය උගන්වන ආචාර්යවරයකුට පංගු පහක්ද, සූත්‍ර පිටකය උගන්වන කෙනෙකුට පංගු හතක්ද, අභිධර්මය උගන්වන ආචාර්යවරයකුට පංගු දොළහක්ද දිය යුතුය යනුවෙනි. මෙහි පැහැදිලිවම අභිධර්මය උගන්වන ගුරුවරයාට විනය සහ සූත්‍ර උගන්වන ගුරුවරයන් දෙදෙනාට ගෙවන මුදලට සමාන මුදලක් ගෙවීමෙන් පෙන්නුම් කෙරෙන්නේ පර්යාප්තියේ ප්‍රබල අංගයන්ට තිබූ වැදගත්කමය. එසේම බුද්ධි වර්ධනය පිළිවෙත් පිරීමට වඩා වටිනා බවද මෙයින් ප්‍රකාශනයට පත් වේ. මුලදී ග්‍රන්ථධූරය යනුවෙන් ගැනුනේ ත්‍රිපිටකය ඉගැන්වීම හා ඉගෙනීමයි. එහෙත් කල් යත් යත්ම මෙම පදයෙහි අර්ථයෙහි අර්ථය වඩාත් පුළුල් වී භාෂාව, ව්‍යාකරණය, තර්ක, න්‍යාය, වෛද්‍ය ශාස්ත්‍ර හා වෙනත් ශාස්ත්‍රද ග්‍රන්ථධුරයෙහිලා ගැනුනේය **(රාහුල හිමි, 2009: 167).**

ග්‍රන්ථධුරයෙහි සහ විදර්ශනධුරයෙහි ව්‍යාප්තිය සහ භික්ෂූන් වහන්සේලා වෙත කරන ලද බලපෑම මහා පරාක්‍රමබාහු රජුගේ කතිකාවතින් පැහැදිලි කරගත හැකිය.

''ග්‍රන්ථධුරයෙහි යෙදෙන උන් විසිනුදු සතතයෙන් විවේකවත් පිරුව මැනවයි වදාළ බැවින් තුන් වේලෙහි ඉරියව් පිරිසිදු කොටැ කාගියාසි ආදීවූ කමටහනක්හි යෙදී දෙතුන් පළගක් හුණු ගන්වා දවසැ කඩ නොකොටැ විවේකවත් පුරවා...'' **(ජයතිලක, 1984: 03)**

මෙම සඳහනට අනුව ග්‍රන්ථධුරයෙහි යෙදෙන භික්ෂූන් වහන්සේලාද කමටහන් ගෙන භාවනාදී කටයුතුවල නිරත විය යුතුය.

''අත්වැඩ පරවැඩ සාධමින් කී පරිද්දෙන් ග්‍රන්ථධූරයෙන් වැඩියක් කොට ගත නොහෙන අන්තේවාසික සද්ධිවිහාරිකයන් ලවා මුල් සිඛ සේඛියා වන පොත් කරවා...චාරිත්‍රානුකූල කමටහන් උගන්වා විදර්ශනාධූරයෙහිමැ යොදා චතුසම්පජඤ්ඤ කථායෙහි වදාළ පරිද්දෙන් දවස් යවනු කොටැ පැවැත් විය යුතු'' **(ජයතිලක, 1984: 03).**

මෙයින් කියවෙන්නේ ග්‍රන්ථධූරය වැඩිදුරට පිරීමට අසමත් භික්‍ෂූන් මූලිකම පොත් පත් හදාරා විදර්ශනා ධූරයෙහිම යෙදිය යුතු බවයි.

මේ තොරතුරුවලින් පැහැදිලි වන්නේ මහා පරාක්‍රමබාහු සිදුකළ සංඝ සාමග්‍රියේදී ග්‍රන්ථධූර සහ විදර්ශනාධූර යන අංගයන් දෙකම අවශ්‍යයැයි පිළිගැනුනද භික්‍ෂූන් වහන්සේලා කොටස් දෙකකට බෙදී සිටීම සුදුසු නොවන බවට පිළිගැනීමක් තිබූ බවකි. කෙසේ වෙතත් මහපැරකුම් කතිකාවත පැහැදිලි කර ඇත්තේ විදර්ශනාධූර පුරන්නන් ග්‍රන්ථධූරයද, ග්‍රන්ථධූරයෙහි යෙදෙන්නන් විදර්ශනාධූරයෙහිද යෙදිය යුතු බවකි.

කෙසේ වෙතත් ක්‍රි. ව. දහවන සියවස වන විටදී නිකායාන්තර භේදයන් ඉක්මවා සංවර්ධනයට පත් වන මෙම ග්‍රන්ථධූර, විදර්ශනාධූර විභජනය හේතුවෙන් නිරන්තරයෙන් සමාජය සමග ගැටෙමින් කටයුතු කරනු ලබන ග්‍රන්ථධූරිකයන් ලෞකික විෂයන් දෙසට නැඹුරු වෙමින් කටයුතු කිරීම නොවැළැක්විය හැකි විය. කාලිංග මාඝ ආක්‍රමණයත් සමග රට අස්ථාවර වන නිසා භික්‍ෂූන් වහන්සේලාටද ස්වාධීනව කටයුතු කරගෙන යාම සඳහා ඉඩ හසර විවෘත වූ බැවින් ප්‍රතිපත්තිය පරයා පර්යාප්තිය පදනම් කරගත් භික්‍ෂු සංස්ථාවක් වර්ධනය වන ආකාරය හඳුනගත හැකිය. දඹදෙණි කතිකාවතේ අන්තර්ගතය පිරික්සීමේදී තදීය යුගය වන විට භික්‍ෂු පැවැත්මේ ස්වභාවය කවරාකාරදැයි යන වග වටහා ගත හැකිව තිබේ.

''ගෘහස්තයන්ට සොලෝ ආදිය බැද නොකිය යුතු''

''කාව්‍ය නාටකාදී ගර්හිත විද්‍යා තමා නූගත යුතු අනුන් නූගැන්විය යුතු'' **(ජයතිලක, 1984: 18)**

යනුවෙන් **දඹදෙණි කතිකාවත** දැක්වීමෙන් පෙනී යන්නේ මේ යුගය වන විට භික්ෂූන් වහන්සේලා ශ්ලෝක නිර්මාණය කිරීම, කාව්‍ය නාටකාදී ශාස්ත්‍රීය විෂයන් පිළිබඳව අධ්‍යාපනය ලැබීම ආදිය සිදු කරන ලද බවයි. මෙකී විෂයන් ඉගෙන ගැනීම නැවැත්වීම සඳහා කතිකාවතින් නියම කොට තිබීමෙන් පෙනී යන්නේ ග්‍රන්ථ ධුරිකයන්ගේ විෂයානුබද්ධ පැතිරීම වැලැක්වීම සඳහා කතිකාවත විසින් උත්සාහ දරා ඇති බවයි. එකී උත්සාහය ඇතැම් විට විදර්ශනා ධුරිකයන්ගේ වීමට බොහෝ දුරට ඉඩ කඩ තිබේ. පර්යාප්තිය සහ ප්‍රතිපත්තිය පදනම් කොට ගනිමින් බිහිවූ බව පෙන්වා දෙන ලද ග්‍රන්ථධුර සහ විදර්ශනාධුර යන ධුරයන්

''හෙරණ සිඛයෙහි කී පරිද්දෙන් හික්මවා ග්‍රන්ථ, විදර්ශනනා ධුරයෙහි වස්වා මතු බුදු සසුන රක්නා ලෙස වර්ධනය කොට ගත යුතු'' **(ජයතිලක, 1984: 11).**

''නිසි වත් පිළිවෙත් නොපමාව වැඩියෝ නම් යටත් පිරිසෙන් හවුරුද්දක් බඩතුරේ විසූ නම් ග්‍රන්ථ, විදර්ශනා ධුරයෙහි අප්‍රමාද වූ නම් ගෙණෙහි සංඝයා මධ්‍යයෙහි...'' **(ජයතිලක, 1984: 12).**

දඹදෙණි කතිකාවත පිහිටුවන ලද දහතුන්වන සියවසවන විටත් පැවති බව උක්ත පාඨයන්ගෙන් සනාථ වේ. එකී පාඨයන්ගෙන් පැහැදිලි කොට ඇත්තේ සෑම භික්ෂුවකම ග්‍රන්ථ ධුරයෙන් හා විදර්ශනා ධුරයෙන් යන ධුර දෙකෙන්ම පරිනත විය යුතු බවකි. මෙකී ප්‍රකාශනය පොළොන්නරු කතිකාවතින්ද විද්‍යමානිත බැවින් වෙන වෙනම ධුර දෙකෙහි භික්ෂූන් හසළ වීම නොව ධුර දෙකෙහිම භික්ෂූන් නිරත වීම නිවැරදි ක්‍රමවේදය බවට එකඟතාවයක් තිබූ බව පෙනේ.

ක්‍රි. ව. දහතුන්වන සියවස වන විටදී ශ්‍රී ලංකේය භික්ෂු සංස්ථාවේ තිබූ ප්‍රධාන විභජනයන් ලෙස හා දඹදෙණි කතිකාවත **(ජයතිලක, 1984: 11)** දක්වන උභයවාසය බිහිවීම පූර්වයෙන් පැහැදිලි කර දෙන ලද පර්යාප්ති, ප්‍රතිපත්ති, ග්‍රන්ථ ධුර, විදර්ශනා ධුර යන බෙදීම්වල ප්‍රතිඵලයක් බව මැන්දිස් රෝහණදීරයෝ ප්‍රකාශ කර සිටිති **(රෝහණදීර, 1974: 81).** එසේ නම් මෙකල **දඹදෙණි කතිකාවත** තුළ ග්‍රන්ථ ධුර සහ විදර්ශනා ධූරයන් වෙනුවට සඳහන් විය යුත්තේ ග්‍රාමවාස හා ආරණ්‍යවාස යනුවෙනි. එහෙත් දඹදෙණි කතිකාවත

තුළ මෙකී නාම සියල්ලක්ම සඳහන් වීම **(ජයතිලක, 1984: 11)** තුළ රෝහණධීර මහතා එළඹෙන නිගමනයේ යම් සංක්ෂයවාදී බවක් මතු කරයි. මැන්දිස් රෝහණධීර මහතාම පෙන්වා දෙන ආකාරයට ග්‍රාමවාස හා ආරණ්‍යවාස යන භේදය ඇතිව තිබෙන්නේ ක්‍රි.ව. 1165 දී සිදු කළ කතිකාවතත් ක්‍රි:ව: 1222 දී තෙවන විජයබාහු රජු සිදු කළ කතිකාවතත් අතරතුර කාලය තුළදීය **(රෝහණධීර, 1974: 81)**. ඒ අනුව කුමන කාරණාවක නිශ්චිත බලපෑමකින් එක එල්ලේම ග්‍රාමවාස හා අරණ්‍යවාස යන උභයවාසයන් බිහි වූ බව කිව නොහැකි නමුත් තත් කාලපරාසයේ බිහිවූ සම්ප්‍රදායන් දෙකක් බව පැහැදිලිය. එකී සම්ප්‍රදායන් ද්විත්වය නියෝජනය කරන සියලු භික්ෂූන් වහන්සේලා ග්‍රන්ථ ධුරය හා විදර්ශනා ධුරය යන ධුරයන් දෙකෙන්ම පොහොසත් විය යුතු බව දඹදෙණි කතිකාවතින් දක්වා තිබීමෙන් **(ජයතිලක, 1984: 11)** පෙනී යන්නේ එක එල්ලේම ග්‍රාමවාස හා අරණ්‍යවාස යන ග්‍රන්ථ ධුර හා විදර්ශනා ධුරයන්ගේ විකාශනයක් නොවන බව පෙනේ. එසේ වුවත් වල්පොල රාහුල හිමියන් හා මැන්දිස් රෝහණධීර මහතා ප්‍රකාශ කරන ආකාරයට ග්‍රාමවාස හා අරණ්‍යවාස යන සම්ප්‍රදායන් දෙකෙහි ප්‍රභවයට පර්යාප්තියට හා ප්‍රතිපත්තියට නැතහොත් ග්‍රන්ථ ධුරය හා විදර්ශනා ධුරය මූලික වන බව හැරෙන්නට එහි ප්‍රභවයට අන් සමීප විය හැකි කිසිදු මතයක් හෝ මූලයක් දක්නට නොවන බැවින් තදීය මතයට සමීප වීමට සිදු වේ. එසේම ග්‍රාම හා අරණ්‍ය යන වාසයන්හි ස්වභාවය විමසා බැලීමේදී එය පර්යාප්තිය හා ප්‍රතිපත්තිය යන කරුණු දෙකට සමපාත වන බැවින්ද එයට එකඟ විය හැකිය.

ග්‍රාමවාස යනුවෙන් සම්ප්‍රදායක් පිළිබඳව ප්‍රථම වරට තොරතුරු හමුවනුයේ ක්‍රි. ව. 1222දී පිහිටු වන ලද දඹදෙණි කතිකාවතෙහිය **(ජයතිලක, 1984: 11)**. එනිසා ග්‍රාමාවසය උපත ලබන්නේ දඹදෙණි යුගයට ආසන්න සමයකදී බව පිළිගන්නට සිදු වෙයි. එසේම සංක්ෂිප්ත අධ්‍යයනයේ ප්‍රමුඛතම කාරණාව වන ග්‍රාමාවාසය පිළිබඳව තොරතුරු සෙවීම සිදුවන්නේද මින් අනතුරුවය. එසේ තොරතුරු සෙවීමට සිදුවන්නේ බොහෝ සෙයින්ම ග්‍රාමවාසය නියෝජනය කළ භික්ෂූන්ගේ ක්‍රියා කලාපවලිනි.

දඹදෙණි යුගය තුළ මහාසාමි ධුරයට පත්වන ප්‍රථම භික්ෂූන් වහන්සේ වූ සංඝරක්ඛිත හිමියන් ග්‍රාමවාසය නියෝජනය කළ භික්ෂුවකි **(ජයතිලක, 1984: 08)**. තුන්වන විජයබාහු රජුගේ රාජ්‍ය

අනුග්‍රහය යටතේ දිවි ගෙවූ මෙම භික්ෂූන් වහන්සේ එතුමා විසින් ඉදි කොට දෙන ලද විජය සුන්දරාරාමයෙහි වාසය කොට ඇත **(ජයතිලක, 1984: 08).** මෙම කාරණා දෙකෙන් තත්කාලීන සමය තුළ ග්‍රාමවාසයේ තත්ත්වය සහ ප්‍රබලත්වය පැහැදිලි කරගත හැකිය. එකළ පැවති වියවුල්කාරී තත්ත්වයන් දුරලීමට කටයුතු කළ විජයබාහු රජු විසින් සිදුකරන ලද ශාසන ශෝධන ක්‍රියාවලිය වන විටත් මාහිමි හෙවත් භික්ෂු ශාසනයේ නායකත්වයේ උපරිම තලය නියෝජනය කිරීමේ අවස්ථාව ග්‍රාමවාසයට හිමිවීම විමසිය යුතුය. තදීය සමය වන විට ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලා සමාජීය වශයෙන් රටෙහි සිදු වන දෑ පිළිබඳව අවබෝධයකින් සිටීමත් රාජ්‍යත්වය සමග සමීපතාවයක් පවත්වාගෙන යාමත් මෙකී නායකත්වය ග්‍රාමවාසය වෙත ලැබීමට හේතුවන්නට ඇත. එසේම විජයබාහු රජු විසින් විජයසුන්දරරාමය තනවා එය සංඝරක්ඛිත හිමි ආදි ග්‍රාමවාසී භික්ෂූන්ට පවරා දීමෙන් පෙනී යන්නේ ග්‍රාමවාසයට රජුගේ පූර්ණ අනුග්‍රහය ලැබී ඇති බවය. මීට අමතරව තෙවන විජයබාහු රජු මිය යාමට මත්තෙන් ඊළඟ රාජ්‍යප්‍රාප්තිකයා වීමට සුදුසුකම් ලබා සිටි දෙවන පරාක්‍රමබාහු, සංඝරක්ඛිත හිමියන් ඇතුළු සංඝයාට පවරා දී තිබේ **(ධම්මානන්ද, (සංස්) 1926: 112); (බුද්ධදත්ත හිමි, (සංස්.) 1959: පරි. 79, ගාථා 75-77).** මෙලෙසින් ලංකාවේ මීළඟ රාජ්‍ය බලධරයා ග්‍රාමවාසී භික්ෂුවක් යටතට පත් කරලීමෙන් ග්‍රාමාවසී භික්ෂූන් පිළිබඳව රාජ්‍ය තන්ත්‍රය තුළ ගොඩනැඟී තිබූ විශ්වාසය ඉතා දැඩි බව පැහැදිලි වේ. පසුකාලීනව කලිකාල සාහිත්‍ය චක්‍රවර්තී පණ්ඩිත යන ගෞරව අභිමානයෙන් පුදන ලබන දෙවෙනි පැරකුම් **(බුද්ධදත්ත හිමි, (සංස්.) 1959: පරි. 80, ගාථා 03)** නිර්මාණය කිරීමේ ගෞරවය ග්‍රාමවාසී භික්ෂූන්ට හිමි විය යුතු බව පෙනෙයි.

**සුසද්ධ සිද්ධි, යොග විනිච්ඡය, සුබෝධාලංකාරය, වුත්තෝදය, ඛුද්දක සික්ඛා සහ සම්බන්ධ චින්තා** යන ග්‍රන්ථයන් මෙම ගම්වැසි සංඝරක්ඛිත මහාසාමිවරයා විසින් රචනා කොට තිබේ **(Malalasekara, 1958: 198).** මෙකී ග්‍රන්ථ පිළිබඳ අවධානය යොමු කිරීමේදී පැහැදිලි වනුයේ ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලා ධර්මය පිළිබඳ අවබෝධයට අමතරව නිරුක්ති, ඡන්දස්, අලංකාර ආදි ශාස්ත්‍රීය කරුණු කාරණාවන් පිළිබඳ දැනුමෙන් පූජිත බවය. පර්යාප්ති ප්‍රමුඛ කොට ගත් ග්‍රාමවාසයේ මෙකී බුද්ධිමය විසරණය වැලැක්වීමට

''ගෘහස්ථයන්ට සොලෝ ආදි බැද නොකිය යුතු''(**ජයතිලක, 1984: 18).**

යන කතිකාවත් පාඨයෙන් උත්සාහ දරා ඇති බව පෙනේ. එහෙත් එකී උත්සාහය භික්ෂු නායකත්වයේ ඉහළම තලය නියෝජනය කළ භික්ෂුවක අතින් ඛණ්ඩනය වීමෙන් පෙනී යන්නේ රාජ්‍ය බලය සමාජ බලය යනාදී බලාධිකාරයන් තමන් සන්තක කොට ගැන්මට ග්‍රාමවාසීන් සමත් වීම නිසා එයට එරෙහි බලවේගවල ඉස්මතු වීමක් සිදු නොවූ බවය.

ග්‍රාමවාසී භික්ෂු සංස්ථාවේ ස්වභාවය කෙසේද යන්න පිළිබඳව තොරතුරු අනාවරණය කරනු ලබන ග්‍රාමාවාසී සම්ප්‍රදාය නියෝජනය කළ තවත් මහාසාමිවරයෙකු ලෙස අත්තනගල්ලේ අනෝමදස්සී මාහිමියන් පෙන්වාදිය හැකිය. මෙම හිමියන් විසින් **දෛවඥකාමධේනුව** හා **පරෝපකාරය** නම් කෘති දෙක රචනා කොට තිබේ. (**රෝහණධීර, 1996: 57-58).** මෙකී කෘතීන්හි අන්තර්ගතය පිරික්සීමෙන් පෙනීයන්නේ සංස්කෘත භාෂාව පිළිබඳව ප්‍රවීනත්වයක් සේම ජ්‍යෝතිෂය පිළිබඳ හසල දැනුමක් අනෝමදස්සී හිමියන් සතුව තිබූ බවය. ග්‍රාමවාසයේ නායකත්වය ඉසුලූ මෙම හිමියන් සතුව මෙබදු දැනුමක් එක්රැස් වන්නට ඇත්තේ ග්‍රාමවාසී සම්ප්‍රදාය තුළ භික්ෂූන් වහන්සේලාට භාෂාව පිළිබඳ දැනුම සේම ජ්‍යොතිෂය වැනි විෂයන්ගේ දැනුමද ග්‍රාමාවාසී භික්ෂූන් වහන්සේලාට ලබා දීම නිසාවෙන් වන්නට ඇත. එසේම **එළුඅත්තනගලු වංසයද** අනෝමදස්සී හිමියන් විසින් රචිත කෘතියක් බැව් එම ග්‍රන්ථයේ සඳහන් වේ. මෙම ග්‍රන්ථයට සංස්කරණයක් සපයන කුමාරතුංග මුණිදාස මහතා පෙන්වා දෙන්නේ උන්වහන්සේ අක්ෂර, ලිඛිත, ගණිත, ගාන්ධර්ව, නක්ෂත්‍ර, ඡන්දස්, නිඝණ්ඩු, අලංකාර, ශාලිහෝත්‍ර, මන්ත්‍ර, ජ්‍යෝතිෂඥාන, ඉතිහාස, පුරාණ ආදි සකල කලා දැන සිටි බවයි. පූර්වයේ සඳහන් කළ ආකාරයට ලෞකික විද්‍යාවන් ලෙසින් සැලකෙන මෙකී විෂයන් පිළිබඳව අවබෝධයක් මේ හිමියන් ලබා සිටියේ ග්‍රාමවාසි භික්ෂු සම්ප්‍රදායේ මෙම සියලු විෂයන් පිළිබඳව අධ්‍යාපනය ලබා දීමක් සිදු කරන ලද නිසා බව තහවුරු වේ.

මීට අමතරව ග්‍රාමවාසී සම්ප්‍රදාය නියොජනය කළ විල්ගම්මුල නම් තෙර නමක් විසින් සිංහල බෝධිවංසය (**ධම්මරක්ඛිත හිමි, (සංස්) 1933: 220)** සහ අනාගත වංසය (**ධම්මානන්ද හිමි, (සංස්.)**

**1934: 186)** යන කෘතීන් රචනා කොට තිබේ. එසේම **සූර්යශතක සන්නයේද විමුක්ති සංග්‍රහයේද** සඳහන් වන තවත් විල්ගම්මුල තෙර නමක් තර්ක, ව්‍යාකරණ, ඡන්දස්, නිඝණ්ඩු, ජ්‍යොතිෂය යනාදී බාහිර ශාස්ත්‍රයෙහි හා සූත්‍රාභිධර්ම විනය සංඛ්‍යාත පිටකත්‍රයෙහි හසළයෙකු සේ හැඳින්වී තිබේ. එසේම **වුත්තමාලා ශතකය** පෙන්වා දෙන්නේ ගලතුරුමුළ, විල්ගම්මුළ, සෙනවිරත්මුළ හා මහතෙර පාමුළ ග්‍රාමවාසී භික්ෂු සම්ප්‍රදාය නියෝජනය කළ භික්ෂූන් වහන්සේලා වැඩ සිටි බවකි. මෙම මූළයන් අතරින් ගලතුරුමුළට අයත් මාහිමි නමක් ෂඩ්භාෂා පරමේශ්වර නාමයෙන් හඳුන්වා ඇති බවයි **(රෝහණදීර, 1974: 180).** මෙකී තොරතුරු තුළ පෙනී යන්නේ ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලා පර්යාප්තිය පදනම් කොට ගනිමින් ග්‍රන්ථකරණයේ ප්‍රසිද්ධව භාෂා ශාස්ත්‍ර පිළිබඳව පුළුල් දැනුමකින් යුක්තව මෙකී සමය තුළ කල්ගෙවා ඇති බවයි.

පහළොස්වන සියවස සහ තදාසන්න සමයේ ග්‍රාමවාසී භික්ෂු සම්ප්‍රදායේ හරයන් කවරාකාරද යන වග අධ්‍යයනයේදී ගිරා සංදේශය අනගි පිටිවහලක් ලබා දෙයි **(සන්නස්ගල, 2009: 321). ගිරා සඳෙස** කාව්‍යාත්මකව තොරතුරු ඉදිරිපත් කළද එයින් ඓතිහාසික කරුණුකාරණා මතු කොට ගැන්මට එය බාධාවක් නොවේ. ගිරාකරු තොටගමු විහාරයේ වූ ගස් දකින්නේ මිහිරි කොට දම් දෙසන උන් මෙනි.

"සබඳ කොවුල් රුව තෙපලෙන් මිහිරි කොට
තුරුද දහම් පිරුවන වැනි වෙහෙර වට"
**(ගම්ලත්, (සංස්.) 2000: 48).**

සමාජය සමග නිතර ගණුදෙණු කරන බැවින් තොටගමු වෙහෙර වැසි භික්ෂුන්ට නිරන්තරයෙන් මිනිසුන්ව ධර්මයෙන් අනුශාසනා කරන්නට සිදු වේ. එනිසා එහි භික්ෂූන් ධර්ම දේශනාවන් නිරන්තරයෙන් පුරුදු පුහුණු කරන්නට ඇත.

ග්‍රාමවාසී භික්ෂු සම්ප්‍රදාය න්‍යායාත්මක හා ප්‍රායෝගික ලක්ෂණයන් ඉස්මතු කරගත හැකි තොරතුරු රැසක් ගිරා සඳෙස විසින් ලබා දෙයි. මෙම පිරිවෙනින් බමුණෝ වේදය හදාරති; **(ගම්ලත්, (සංස්.)**

**2000: 32)** සමහරක් සූර්ය සිද්ධාන්ත ඉගෙන ගනිති; **(ගම්ලත්, (සංස්.) 2000: 32)** වෛද්‍යවරු වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙන ගනිති; **(ගම්ලත්, (සංස්.) 2000: 32)** තවකෙක් අර්ථ ශාස්ත්‍රය හදාරති; **(ගම්ලත්, (සංස්.) 2000: 32)** මෙම විෂයයන් සියල්ලම ත්‍රිපිටක ධර්මයෙන් පරිබාහිර ලෞකික විෂයන්ය. පූර්වයෙන් සඳහන් කළ ග්‍රාමවාසය නියෝජනය කළ සංඝරක්ඛිත, අනෝමදස්සී හා විල්ගම්මුල යන හිමිවරුද මෙකී විෂයන්හි පාරප්‍රාප්ත බව දක්වන ලදි. **ගිරා සංදේශයේ** සඳහන් තොරතුරුවලින් එකී සත්‍යතාව තවදුරටත් තහවුරු වෙයි. එසෙම මෙහි වේදය හදාරණ බමුණෝද සිටි බව සඳහන් වීමෙන් පෙනීයන්නේ අන්‍ය සමයාන්තර දැනුමෙන් ද ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලා පොහොසත්ව සිටි බවකි. එසේම තොටගමු විජයබා පිරිවෙන මෙලෙසින් තත් යුගයේ අධ්‍යයනය කරන ලද ශාස්ත්‍රයන් දෙස බැලීමේදී පෙනී යන්නේ ලෞකික ලෝකය තුළ සියලු පරාසයන් ආවරණය වන ආකාරයට කටයුතු කොට ඇති බවය.

ලෞකික විෂයන්ට අමතරව ලෝකෝත්තර පාර්ශ්වයට අදාල විෂයන්ද විජයබා පිරිවෙන තුළ අධ්‍යාපනය ලබාදී තිබේ. එහි ප්‍රථමයෙන්ම සඳහන් වන්නේ

''සිත සොම්නසින් සිහි කර බුදු ගුණය

අවිදම් පෙළ අරුත් විමසන සඟ ගණය''

**(ගම්ලත්, (සංස්.) 2000: 90).**

යනුවෙන් සඳහන් වන ආකාරයට අභිධර්මය අධ්‍යාපනය පිළිබඳවය. පර්යාප්තිය පෙරටු කොටගත් භික්ෂූන් අතර අභිධර්මයේ ප්‍රබලත්වය ඉස්මතු වීම පිළිබඳව පූර්වයෙන් සාකච්ඡා කරන ලදී. එහි වටිනාකම ග්‍රාමාවසී භික්ෂු සම්ප්‍රදාය තුළ පහළොස්වන සියවසේදීද නොනැසී පැවති බව ගිරාකරු විසින් මෙලෙස විජයබා පිරිවනේ ත්‍රිපිටකය අතුරින් අභිධර්මය පිළිබඳව ප්‍රථමයෙන් සඳහන්ව තිබීමෙන් මැනවින් පැහැදිලි වේ. අනතුරුව සූත්‍ර ධර්ම පිළිබඳව අධ්‍යාපනය ලබාදීම සම්බන්ධයෙන් තොරතුරු දැක් වේ.

''අතුරු දහන් කෙරෙමින් සිවු අව මඟය
සුතුරු දහම් පවසන සමහර සඟය''
**(ගම්ලත්, (සංස්.) 2000: 50).**

විනය පිළිබඳව අධ්‍යාපනය ලබාදීමේ මෙම ග්‍රාමවාසී සම්ප්‍රදායේ සිදු කොට ඇත්තේ අවසානයටය.

''පැන සර අදුරු උවදෙස් බස දැන ගෙනය
නොමහැර ගැඹුරු තැන් විමසති විනය නය''
**(ගම්ලත්, (සංස්.) 2000: 50).**

මෙලෙසින් ග්‍රාමවාසය නියෝජනය කළ තොටගමු විජයබා පිරිවෙන තෙවලා දහම පිළිබඳව නිරවුල් අවබෝධයක් ස්වකීය සම්ප්‍රදාය නියෝජනය කළ භික්ෂූන්ට ලබා දීමට කටයුතු කරන ලද බව වටහාගත හැකිය.

මීට අමතරව ග්‍රාමවාසී සම්ප්‍රදාය තුළ විවිධ භාෂාවන් පිළිබඳ දැනුම ලබාදී ඇති බව පෙනෙයි.

''සිරිමත් සොඳුරු එවෙහෙර තැන තැන ලකුළු
ඉඳසිත් ලෙසට පෙර කිවියර සිරි රැකළු
දැනගත් සඳලකර වියරණ වියත් මුළු
පවසත් සකු මගද එළු දෙමළ කව් නළු''
**(ගම්ලත්, (සංස්.) 2000: 51).**

මෙම කවියේ දැක්වෙන ආකාරයට සඳ, ඡන්දස්, ලකර-අලංකාර, වියරණ ව්‍යාකරණ, සකු-සංස්කෘත, මගධ-පාලි, එළු-සිංහල, දෙමළ-ද්‍රවිඩ ආදි වශයෙන් භාෂාත්මක දැනුමෙන් භික්ෂූන් වහන්සේලා පොහොසත් කිරීමට කටයුතු කොට ඇති බැව් වටහාගත හැකිය. එසේම ගිරා සඳෙසේ සඳහන් වන

''සමහරු රුැවි සතර පිරුවති නොයෙක තැන''
**(ගම්ලත්, (සංස්.) 2000: 51).**

පාඨයට විවරණ සපයන සුචරිත ගම්ලත් ප්‍රකාශ කරන්නේ ලෞකික ජීවිතයේ සාර්ථකත්වයට උරදෙන අර්ථ ශාස්ත්‍රය පිළිබඳව ඉගැන්වීම්ද මෙම විද්‍යායතනයෙන් සිදු කොට ඇති බවයි **(ගම්ලත්, (සංස්.) 2000: 160).**

ග්‍රාමවාසය කෙබඳු ආකාරයදැයි වටහා ගැන්ම සඳහා උරදෙන මෙකී තොරතුරුවලට අමතරව **ගිරා සංදේශයේ** සඳහන් වන රාහුල හිමියන් පිළිබඳව පවසන තොරතුරු හරහාද ග්‍රාමාවසී සම්ප්‍රදායේ ස්වභාවයන් කවරේද යන වග තහවුරු කරගත හැකිව තිබෙයි. ගිරා සංදේශ රචකයා පෙන්වා දෙන්නේ තොටගමුවේ රාහුල හිමියන් දහඅටක් වූ පුරාණ පිළිබඳව හසළ දැනුමැත්තෙකු බවයි **(ගම්ලත්, (සංස්.) 2000: 33).** මෙහි දහඅටක් පුරාණ යනුවෙන් හැඳින්වෙන්නේ බ්‍රහ්ම, පද්ම, විෂ්ණු, ශිව, භගවත්, නාරද, මාර්කණ්ඩේය, අග්නි, භවිෂ්‍යත්, බ්‍රාහ්ම වෛර්ත, ලිංග, වරාහ, ස්ඛන්ධ, වාමන, කූර්ම, මත්ස්‍ය, ගරුඩ, බ්‍රහ්මාණ්ඩ යන ග්‍රන්ථයන්ය **(ගම්ලත්, (සංස්.) 2000: 171).** මෙකී ග්‍රන්ථවල අන්තර්ගතව ඇත්තේ හින්දු ධර්මය පිළිබඳ දැනුමැත්තෙකු වීමෙන් තහවුරු වන්නේ එකී ආයතනය තුළ ශාස්තොද්ග්‍රහණය කළ ඡාත්‍රයන්ටද එකී දැනුම බෙදා දෙන්නට ඇති බවයි. එසේම රාහුල හිමියන්ට මහා කාව්‍යයන් පිළිබඳ පූර්ණ ඥානයක් තිබූ බව ගිරා සන්දෙශය පවසයි **(ගම්ලත්, (සංස්.) 2000: 53).** මහා කාව්‍යයන් ලෙස හැඳින්වෙන්නේ **රඝුවංශය, කව්සිළුමිණ, කාව්‍යශේඛරය** ආදි ග්‍රන්ථයන්ය. මෙබඳු ආකාරයට සමය පිළිබඳ ශාස්ත්‍රීය කරුණුවලින් රාහුල හිමියන් පොහොසත්ව සිටීමෙන් තදීය ග්‍රාමීය භික්ෂු සම්ප්‍රදායේ ස්වරූපය කවරාකාර වූයේ ද යන වග වටහා ගත හැකිය.

## නිගමනය

මෙලෙසින් ග්‍රාමවාසී භික්ෂු සම්ප්‍රදායේ ප්‍රභවය සහ එහි න්‍යායාත්මක කරුණු සම්බන්ධයෙන් අධ්‍යයනය කරන කල්හි පෙනී යනුයේ පැහැදිලිවම පර්යාප්තිය පදනම් කොට ගත් භික්ෂු පිරිසක් මෙකී සම්ප්‍රදාය නියෝජනය කරන ලද බවය. ග්‍රාමවාසී සම්ප්‍රදායේ නායකත්වය උසුලන ලද භික්ෂූන් වහන්සේලා පිළිබඳව සේම එකී භික්ෂූන් වහන්සේලා අධිපතීත්වය දරන ලද ආයතනයන්හි අන්තර්ගත තත්ත්වය විමසීමේදී පෙනී යන්නේ ආධ්‍යාත්මීය සංවර්ධනය වඩා

බාහිරි සමාජය සමග ගැටෙමින් සමාජීය තත්ත්වයන්හි උන්නතිය උදෙසා කැපවීමෙන් කටයුතු කරන භික්ෂූන් පිරිසකගේ සමවාසයෙන් ග්‍රාමවාසය නිර්මාණය වී ඇති බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ආනන්ද මෛත්‍රීය හිමි, බළන්ගොඩ. (සංස්.) (1995), **ධම්මපද පාළිය සහ සිංහල ධම්ම පදය**, නුගේගොඩ: මොඩන් පොත් සමාගම.

ගම්ලත්, සුචරිත. (සංස්.) (2000). **ගිරා සංදේශය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයතිලක, ඞී.බී. (1984). **කතිකාවත් සඟරා.** කොළඹ: ඇම් ඞී ගුණසේන සහ සමාගම.

ධම්මරක්ඛිත හිමි, බද්දේගම. (සංස්.) (1933). **බෝධිවංශය**, කොළඹ: ප්‍රකාශන ආයතනය සඳහන් නොවේ.

ධම්මානන්ද හිමි, වටද්දර. (සංස්.) (1934). **අනාගතවංශය.** කොළඹ:.

ධම්මානන්ද හිමි, වලානේ. (සංස්.) (1926). **පූජාවලිය.** කොළඹ: ජිනාලංකාර යන්ත්‍රාලය.

ධම්මකුසල හිමි, අම්බලන්තොට. (සංස්.) (1957). **මහාවග්ගපාලි**, බු.ජ.මු. කොළඹ: රජයේ මුද්‍රණාලය.

පඤ්ඤානන්ද හිමි, යගිරල. (සංස්.) (1932). **සම්මෝහ විනෝදනී.** කොළඹ: ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණාලය.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (සංස්.) 1959). **ඌණ පූර්ණ සහිත මහාවංසෝ,** කොළඹ: ඇම්. ඞී. ගුණසේන සහ සමාගම.

රාහුල හිමි, වල්පොල. (2009). **ලක්දිව බුදුසමයේ ඉතිහාසය.** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රෝහණදීර, මැන්දිස්. (1974). **ශ්‍රී ලංකාවේ සංඝ සංවිධානය.** නුගේගොඩ: දීපානි ප්‍රකාශකයෝ.

රෝහණදීර, මැන්දිස්. (1996). **ශ්‍රී ලංකාවේ මහාසාමි සංඝරාජ සඝ පරපුර.** ගංගොඩවිල: දීපානි මුද්‍රණ.

සන්නස්ගල, පුංචි බණ්ඩාර. (2009). **සිංහල සාහිත්‍ය වංශය.** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**අංගුත්තර නිකාය**, ඒකක නිපාතට්ඨ කථා, දුතිය පමාදාදී වග්ග වණ්ණනා, 10. 130, Chatta sangayana CD ROM.

**දීඝ නිකාය**, පාථික වග්ග අට්ඨකථා, සම්පසාදනී සුත්ත වණ්ණනා, 5. 161, Chatta sangayana CD ROM¦

**ධම්මපදට්ඨ කථා**, යමක වග්ග, චක්ඛුපාල ථෙර වත්ථු, 01.01, Chatta sangayana CD ROM'

**මජ්ඣිම නිකාය**, උපරිපණ්ණාසක අට්ඨකථා, අනුපද වග්ග, බහුධාතුක සුත්ත වණ්ණනා, 2. 129, Chatta sangayana CD ROM.

Malalasekara, G.P. (1958). **The Pali literature of Ceylon**. Colombo.

Wikcramasingha, D.M.D.Z. (ed.) (1928). **Epigraphia Zeylanica**. Vol. I. London: Oxford university press.